# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1418/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 13/11/2023<br>පැය 0830 |

## මාධ්‍ය නිවේදනය

### 01. සැකකටයුතු මරණයක් - බිංගිරිය පොලිස් වසම.

2023.11.12 වන දින සවස් කාලයේදී බිංගිරිය පොලිස් වසමේ දිගන්වෙල, වැල්ලරාව ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු මියගොස් සිටියදී බිංගිරිය රෝහලට ඇතුලත් කර ඇති බවට බිංගිරිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 21 ක් වූ වැල්ලරාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු 2023.11.12 වන දින තවත් පුද්ගලයින් කිහිපදෙනෙකු සමඟ ප්‍රදේශයේ පිහිටි පොල්වත්තක මත්පැන් පානය කරමින් සිට ඇති අතර එම අවස්ථාවේ ඇතිවූ අසනීප තත්වයක් හේතුවෙන් මෙලෙස රෝහල් ගත කර ඇත. මරණයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය හා පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදුකිරීමට නියමිතව ඇත. බිංගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. දියේ ගිලී අතුරුදහන් වීමක් - කොස්වත්ත පොලිස් වසම.

2023.11.12 වන දින දහවල් කාලයේ කොස්වත්ත පොලිස් වසමේ පලුවැල්ගාර ප්‍රදේශයේ පිහිටි කොස්වතු ඔයේ කඩවල ඇනිකට් එක අසල දියනෑමට ගිය තරුණයින් තිදෙනෙකු අතරින් එක් අයෙකු සැඩ පහරට හසුව ගසාගෙන ගොස් අතුරුදහන්ව ඇති බවට කොස්වත්ත පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**අතුරුදහන්වූ අය වයස අවුරුදු 23 ක් වූ පලුවැල්ගාර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුදහන් වූ අය තම මිතුරන් දෙදෙනෙකු සමඟ කොස්වතු ඔයේ කඩවල ඇනිකට් එක අසල දිය නාමින් සිටියදී එකවරම ඇති වූ අධික සැඩ පහර හේතුවෙන් ගසා ගෙන ගොස් මෙලෙස අතුරුදහන්ව ඇත. පොලිස් හා නාවික කිමිදුම් නිලධාරින්ගේ සහය ඇතිව අතුරුදහන් වූ අය සෙවීමේ කටයුතු කොස්වත්ත පොලිසිය මගින් සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හෝමාගම පොලිස් ස්ථානය.**

2023.11.12 වන දින උදෑසන කාලයේ හෝමාගම පොලිස් වසමේ මූකලාන හන්දියේදී හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක්වූ පිටිපන දකුණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හෝමාගම පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. මාරක රිය අනතුරක් - පාදුක්ක පොලිස් වසම.**

2023.11.12 වන දින උදෑසන කාලයේ පාදුක්ක පොලිස් වසමේ පාදුක්ක ඉංගිරිය මාර්ගයේ අරුක්වත්ත ප්‍රදේශයේදී පාදුක්ක දෙස සිට ඉංගිරිය දෙසට ධාවනය වූ වෑන් රථයක් මාර්ගයේ විරුද්ධ මංතිරුවට ධාවනය වීම හේතුවෙන් මාර්ගය අයිනේ සිටි පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදික කාන්තාව හෝමාගම රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 43 ක් වූ අංගමුව, පාදුක්ක ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය හෝමාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් වෑන් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. පාදුක්ක පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**